## 13 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය 9 වන සතිය ජූනි 29 සිට ජූලි 03 දක්වා

## නිපුණතා මට්ටම 17.5 - කළමනාකරණ ශ්‍රිත අනුව තොරතුරු පද්ධති වර්ග කරයි.

## නිපුණතා මට්ටම 17.6 - තොරතුරු තාක්ෂණය විමසමින් එහි ප්‍රතිලාභ අනාවරණය කරයි.

තොරතුරු පද්ධතියෙන් තොරතුරු ලබා දෙන්නේ කුමන කළමනාකරණ ශ්‍රිතයටද යන කාරණය සලකා තොරතුරු පද්ධති පහත සඳහන් පරිදි වර්ග කළ හැකිය.

1.මෙහෙයුම් තොරතුරු පද්ධති

2.අලෙවිකරණ තොරතුරු පද්ධති

3.මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධති

4.මානව සම්පත් කළමනාකරණ  තොරතුරු පද්ධති

5.පර්යේෂණ හා සංවර්ධන තොරතුරු පද්ධති

### තොරතුරු තාක්ෂණය -

විදුලි සංදේශ හා පරිගණක තාක්ෂණය ඔස්සේ වාචික,රූපමය,අක්ෂරමය හා අංකමය තොරතුරු අත්පත් කර ගැනීම,සැකසීම,ගබඩා කිරීම හා බෙදා හැරීමයි.

තොරතුරු තාක්ෂණය විවිධ ක්ෂේත්‍ර කීපයක එකතුවකි.

එනම්,

1.ගණනය කිරීමේ තාක්ෂණය

2.සන්නිවේදන තාක්ෂණය

3.තොරතුරු කළමනාකරණ තාක්ෂණය

### අභ්‍යාස

1.තොරතුරු තාක්ෂණයේ වැදගත්කම පිළිබඳ කරුණු පහක් දක්වන්න.

2.තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ පහක් දක්වන්න.